ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය Business & Accounting Studies 60 S I, II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) තරග විභාගය 2014 ජූලි
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை,2014 டிசெம்பர்
Genaral Certificate of Education (Ord. Level) Examination, July 2014

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය I, II
வணிகக் கல்வியும் கணக்கீடும் I, II
**Business and Accounting Studies I, II**

## ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය II

- ❖ පළමුවන ප්‍රශ්නය ඇතුලු සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
- ❖ පිළිතුරු පැහැදිලි අත් අකුරින් ලියන්න.

01. සුමේධ, සමාගමක ලිපිකරුවෙකු ලෙස සේවය කල පුද්ගලයෙකි. ඔහුට අවු. 55 ක් වූ පසු ඔහු තම රැකියාවෙන් විශ්‍රාම ගැනීමට තීරණය කළහ. ඔහුට රු. ලක්ෂ 20ක් අර්ථසාධක හිමිකමක් ලැබිණි. මොහු මෙම මුදල භාවිත කොට තමන්ගේම ව්‍යාපාරික කටයුත්තක් සිදු කිරීමට තීරණය කරයි. සුමේධ අවු. 25ක් පමණ වාණිජ ක්ෂේත්‍රයේ සිටි බැවින් අත්දැකීම් ද, වර්තමාන වෙළෙඳ පොල අවශ්‍යතා හා වුවමනා පිළිබඳව හොඳ අවබෝධයක් ඇත. ප්‍රදේශයේ සේවකයින් 4000ක් පමණ වැඩ කටයුතු කරන, සිසුන් 2500ක් අධ්‍යාපනය ලබන සිරි සුමංගල මධ්‍ය මහ විද්‍යාලයට යාබදව එමෙන්ම මහාමාර්ගයට යාබදව කාමර කොටසක් මේ සඳහා ඔහු තෝරා ගත්තේ ය. මෙම ව්‍යාපාරය සුමේධ කොමියුනිකේෂන් යනුවෙන් නම් කළ අතර, අවශ්‍ය නීතිමය අවශ්‍යතාවයන් ද සම්පූර්ණ කර පහත සඳහන් දෑ 2014.01.01 දින මිලට ගෙන ව්‍යාපාරය ආරම්භ කරන ලදි.

- ❖ ඡායා පිටපත් යන්ත්‍ර 3 (එකක් රු. 20,000 බැගින්)
- ❖ ෆැක්ස් යන්ත්‍ර 1 (එකක් රු. 80,000 බැගින්)
- ❖ රු. 75,000 ක් වටිනා ලී බඩු හා සවිකිරීම් ද
- ❖ රු. 400,000 ක් වටිනා කාමර කැබැල්ලක් ද
- ❖ දුරකථන හා අන්තර්ජාල පහසුකම් වියදම් රු. 9,000
- ❖ සේවකයකු බඳවා ගත් අතර මසකට රු. 15,000 ක වැටුපක් ගෙවයි.

ව්‍යාපාරය අනාගතයේ පොදු සමාගමක් බවට පත් කරලීමට අපේක්ෂා කරයි.

01. සුමේධ, මෙම ව්‍යාපාරය ඇරඹීමේ දී බලපාන බාහිර සාධක 2ක් ලියන්න.
02. ඉහත ව්‍යාපාරය සි/ස පොදු සමාගමක් බවට පරිවර්තනය කිරීමෙන් ලැබෙන ප්‍රතිලාභ 2ක් නම් කරන්න.
03. මෙම ව්‍යාපාරය,
    - අ. නිෂ්පාදන ස්භාවය අනුව
    - ආ. අයිතිය අනුව

    අයත් වන අංශය නම් කරන්න.
04. ව්‍යාපාර කටයුතු ඉදිරියට ගෙන යාම සඳහා සුමේධ ආරම්භ කිරීමට සුදුසු බැංකු ගිණුම් වර්ගයක් ලියා එම ගිණුමෙන් සුමේධට ලබා ගත හැකි වාසි 2ක් ලියන්න.
05. මෙම ව්‍යාපාරය ජනතාව අතර ජනප්‍රිය කිරීම සඳහා යොදා ගත හැකි ලිඛිත සන්නිවේදන ක්‍රමයක් හා විද්‍යුත් සන්නිවේදන ක්‍රමයක් වෙන වෙනම ලියන්න.
06. මෙම ව්‍යාපාරයේ දියුණුවට බලපාන උපකාරක සේවා 2ක් නම් කරන්න.
07. ඉහත සිද්ධියට අදාල දීර්ඝ කාලින ප්‍රතිලාභ ගෙන දෙන වියදමක් හා කෙටිකාලින ප්‍රතිලාභ ගෙන දෙන වියදමක් සඳහා උදාහරණය බැගින් දෙන්න.
08. පහත අවස්ථා සඳහා ද්විත්ව සටහන් ලියන්න.
    - ❖ ෆැක්ස් යන්ත්‍රයේ කාර්යක්ෂමතාව වැඩි කරලීමට රු. 5,000 ක නවීන උපකරණයක් ෆැක්ස් යන්ත්‍රයට සවි කිරීම.
    - ❖ සුමේධගේ පුතා, තමාගේ පාසලේ කාර්යයක් සඳහා රු. 1,500ක් වටිනා ඡායාපිටපත් රැගෙන යාම.
09. ඉහත ව්‍යාපාරය ආරම්භක දිනට (2014.01.01 දිනට) ප්‍රාග්ධනය ගණනය කරන්න.
10. ජනවාරි මාසයේ මුදල් පොතේ බැංකු ගිණුමේ ශේෂයත් බැංකුවේ ගිණුමේ ශේෂයත් එකිනෙකට වෙනස් විය. වෙනසට හේතු සෙවීමේ දී නිකුත් කල නමුත් ඉදිරිපත් නොවූ චෙක්පත් වල වටිනාකම සොයා ගැනීමට සිදු විය. ජනවාරි මාසයේ රු. 30,000 ක වටිනාකමකින් යුත් චෙක්පත් නිකුත් කර ඇති අතර එයින් රු. 14,000 ක චෙක්පත් ජනවාරි මාසයේ ඉදිරිපත් වී තිබුණි. තවත් රු. 12,000 ක චෙක්පත් 2014.02.02 දින ඉදිරිපත් වී තිබුණි. ජනවාරි මාසයේ නිකුත් කළ නමුත් ඉදිරිපත් නොවූ චෙක්පත් ලෙස බැංකු සැසඳුමට යොදන වටිනාකම කීයද ?

*(ලකුණු 02 x 10 = 20 යි)*

## I කොටස - ව්‍යාපාර අධ්‍යයනය

**(ප්‍රශ්ණ සියල්ලට ම පිළිතුරු සපයන්න.)**

02. i. පොදුවේ පිළිගත් ආකාරයට නිෂ්පාදනය මූලික වශයෙන් බෙදෙන කොටස් මොනවා ද?

ii. විද්‍යුත් වාණිජ්‍ය (E-Commerce) යනු කුමක්ද?

iii. ව්‍යාපාර සැලැස්මක අන්තර්ගත කරුණු මොනවා ද?

iv. පහත සඳහන් ප්‍රවෘත්තීන් සාර්ව පරිසර සාධක වලට වෙන්කර දක්වන්න.

❖ අධික නියගය නිසා උතුරු මැද පළාතේ කුඹුරු අක්කර දහස් ගණනක් විනාශයට පත්වීම

❖ වෙළෙඳ පොලේ සහල් මිල ගණන් ඉහළ යාම

❖ බෞද්ධාගමිකයින් මාංශ අනුභයෙන් වැලකී සිටිම.

❖ ශ්‍රී ලංකාවේ ජනගහනය මිලියන 20 තෙක් ඉහල යාම.

v. පහත දැක්වෙන්නේ යෝගට් නිෂ්පාදන ආයතනයක මාසයකට අදාල තොරතුරු ය. අළෙවි සැලැස්මක් තුළින් පහත දෑ ගණනය කරන්න.

| | |
|---|---|
| නිෂ්පාදන ඒකක ගණන | 200 |
| ඒකකයක විකුණුම් මිල | රු. 20 |
| වියදම | රු. 400 |

අ. අපේක්ෂිත වාර්ෂික විකුණුම් ආදායම

ආ. අපේක්ෂිත වාර්ෂික ලාභය *(ලකුණු 02 x 05 = 10 යි)*

03. i. "නුවරඑළිය ප්‍රදේශයේ දැඩි වර්ෂාපතනය හේතුවෙන් කොළඹ ප්‍රදේශයේ එළවළු මිල ගණන් ඉහල ගොස් ඇත". මෙම කියමන තුළ ඇති සම්බන්ධය පැහැදිලි කරන්න.

ii. කුඩා පරිමාණයේ තේ කොළ පැකට්කර අළෙවි කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන ගිය සජිත්, ව්‍යාපාරය පුළුල් කිරීමට අදහස් කර නයනජිත් ව්‍යාපාරයට බඳවා ගනී. නව ව්‍යාපාරය තුලින් අයත්වන ප්‍රතිලාභ 2 ක් සඳහන් කරන්න.

iii. "විද්‍යුත් මුදල්" හොඳ මුදලක් ලෙස පිළිගැනීමට හේතු මොනවා ද?

iv. අ. "කල්බදු සමාගම" යන්න හඳුන්වන්න.

ආ. වාණිජ බැංකු වලින් ලබා ගත හැකි විදේශ විනිමය ආශ්‍රිත සේවා 2ක් ලියන්න

v. රටක මාර්ග පද්ධතිය සංවර්ධනය වීම තුලින් ව්‍යාපාරිකයින්ට අත්කරගත හැකි ප්‍රතිලාභ කවරේද?

*(ලකුණු 02 x 05 = 10 යි)*

## II කොටස - ගිණුම්කරණය

**(ප්‍රශ්ණ සියල්ලට ම පිළිතුරු සපයන්න.)**

04. අ. පහත දැක්වෙන ගනුදෙනු,

**වත්කම් = ප්‍රාග්ධනය + වගකීම්** සමීකරණයට ඇතුලත් කර පෙන්වන්න.

01. අයිතිකරු ප්‍රාග්ධනය යෙදුවා රු. 200,000
02. ලී බඩු තොගයක් ව්‍යාපාරයට ගත්තා රු. 10,000
03. විදුලි බිල ගෙව්වා රු. 3,400
04. පොලි ආදායමක් ලැබුණා රු. 2,800
05. ණයහිමියන්ට මුදල් ගෙව්වා රු. 3,400

*(ලකුණු 2.5 යි)*

ආ. පහත සඳහන් ගනුදෙනු සඳහා ද්විත්ව සටහන් ලියන්න.

01. වට්ටමක් ලැබුණා රු. 2,000

02. ණයගැතියකුගෙන් මුදල් ලැබුණා රු. 20,000

03. ණයට විකුණූ භාණ්ඩ වලින් රු. 5,600 භාණ්ඩ ආපසු එවා තිබුණා.

04. රු. 20,000 ක භාණ්ඩ ණයට ගැනීම.

05. පෞද්ගලික ප්‍රයෝජනයට රු. 3,000 ව්‍යාපාරයෙන් ආපසු ගැනීම. *(ලකුණු 2.5 යි)*

ඉ. 2014.01.31 දිනට අවින්ද්‍යාගේ ව්‍යාපාරයේ මුදල් පොතේ පරිදි බැංකු ශේෂය රු. 10,100 කි. එහෙත් එදින ලද බැංකු ප්‍රකාශයේ ශේෂය මීට අසමාන වූ හෙයින් වෙනසට හේතු මෙසේ සොයා ගන්නා ලදි.

01. තැන්පත් කළ රු. 8,700 ක චෙක්පත් වලින් 2014.01.31 දින වන විට රු. 5,000 ක චෙක්පත් පමණක් ගිණුමට බැර වී තිබුණි.

02. බැංකුව විසින් ගෙවන ලද රු. 3,000 ගෙවල් කුලී වියදම හා රු. 2,000 පොලී ආදායම මුදල් පොතේ සටහන් වී නොමැත.

03. නිකුත් කළ චෙක්පත් රු. 4,000 මේ වන විට ගෙවීමට බැංකුවට ඉදිරිපත් වී නැත.

04. මුදල් පොතේ බැරට සටහන් විය යුතු රු. 250 චෙක්පොත් ගාස්තු හා රු. 500 බැංකු ගාස්තු මුදල් පොතේ සටහන් නොවිය.

**අවශ්‍ය වන්නේ,**

අ. 2014.01.31 දිනට සංශෝධනය කළ මුදල් පොත.

ආ. 2014.01.31 දිනට බැංකු සැසඳුම් විස්තරය පිළියෙල කරන්න.

*(ලකුණු 05 යි)*
*(මුළු ලකුණු 10 යි)*

05. අ. පහත ගනුදෙනු පොදු ජ්නලයේ සටහන් කර ප්‍රාග්ධනය සොයන්න.

| | |
|---|---|
| යන්ත්‍ර | රු. 150,000 |
| ලී බඩු | රු. 75,000 |
| ණයහිමියෝ | රු. 175,000 |
| මුදල් | රු. 20,500 |
| මෝටර් රථය | රු. 220,000 |
| බැංකු අයිරාව | රු. 90,500 |

*(ලකුණු 2.5 යි)*

ආ. ආධුනික ගිණුම් ලිපිකරුවෙකු විසින් 2014.03.31 දිනට පිළියෙල කල ශේෂ පිරික්සුම පහත දැක්වේ. එහි වැරදි ඇති තැන් හඳුනාගෙන ඒවා නිවැරදි කර 2014.03.31 දිනට නැවත ශේෂ පිරික්සුමක් පිළියෙල කරන්න.

**ශේෂ පිරික්සුම**

| විස්තරය | හර | බැර |
|---|---|---|
| ප්‍රාග්ධනය | | 90,000 |
| ගැණුම් | | 110,000 |
| විකුණුම් | 125,000 | |
| යන්ත්‍ර | 90,000 | |
| ලී බඩු | 35,500 | |
| ලද ගෙවල් කුලී | | 15,000 |
| බැංකු ණය | 60,000 | |
| විදුලිය | | 8,600 |
| විවිධ ආදායම් | | 6,200 |
| රක්ෂණය | | 2,400 |
| මුදල් ශේෂය | 7,500 | |
| බැංකු අයිරාව | | 10,000 |
| ගෙනඒමේ කුලී | | 2,200 |
| ආයෝජන | | 25,000 |
| ණයගැතියෝ | | 45,000 |
| ණයහිමියෝ | 20,000 | |
| | 338,000 | 314,000 |

*(ලකුණු 2.5 යි)*

ඉ. පහත දැක්වෙන්නේ චරණගේ ව්‍යාපාරයේ 2014 ජනවාරි මාසයට අදාල සුළු වියදම් කිහිපයකි.

| | | | |
|---|---|---|---|
| 2014 ජනවාරි | 01 | ශේෂය ඉ/ගෙ | 6,200 |
| | | අග්‍රිමය ප්‍රතිපූරණය කළා | |
| | 03 | ගමන් ගාස්තු | 210 |
| | 05 | මුද්දර ගත්තා | 800 |
| | 10 | ලිපිද්‍රව්‍ය ගාස්තු | 400 |
| | 12 | බස් ගාස්තු | 300 |
| | 16 | ලියුම් කවර | 150 |
| | 22 | යසංග ට ගෙව්වා | 1,000 |
| | 24 | විවිධ වියදම් | 600 |
| | 27 | මේසයක් ගත්තා | 1,800 |
| | 29 | ගෙනඒමේ කුලී | 1,100 |
| | 31 | ශේෂය ප/ගෙ | 640 |

ඉහත තොරතුරු ගමන්, තැපල්, ලිපිද්‍රව්‍ය හා විවිධ යන විශ්ලේෂණ තීරු වල ඇතුලත් කර 2014 පෙබරවාරි 01 දිනට අග්‍රිමය ප්‍රතිපූරණය කර දක්වන්න.

*(ලකුණු 05 යි)*
*(මුළු ලකුණු 10 යි)*

සා.පෙළ ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයන දේශක

සිසිර කුමාර විසින් සම්පාදිත යි.